# පළාත් පාලන මැතිවරණය පැවැත්වීම සඳහා අත්‍යවශ්‍ය ප්‍රතිසංස්කරණ
## සංකල්ප පත්‍රිකාව

### පසුබිම
වර්ෂ 2017 දී කාන්තා නියෝජනය සඳහා 25% කෝටාව හඳුන්වා දීමෙන් පළාත් පාලන සහ පළාත් සභා මට්ටමේ කාන්තා නියෝජනය තහවුරු කිරීමට හැකියාව ලැබිණි. වර්ෂ 2018 දී පැවති පළාත් පාලන මැතිවරණයෙන්, අති බහුතර පළාත් පාලන ආයතනවල 25%ක කාන්තා නියෝජනය තහවුරු විය. එහෙත්, එම ක්‍රියාවලිය තුළදී, එතෙක් පැවති සංයුතියට බඛාධාවක් නොවන අයුරින් එය සිදු කිරීම හේතුවෙන් නියෝජිතයන් සංඛ්‍යාව 8000 පමණ දක්වා ඉහළ ගියේය. එය, 2012 සංශෝධනයෙන් පසුව 6000 පමණ ඉහළ ගොස් තිබුණ ද වර්ෂ 2015 දක්වා ක්‍රියාත්මක පළාත් පාලන ආයතනවල නියෝජිත සංඛ්‍යාව 4500 පමණ විය. වර්ෂ 2023 අංක 30 දරන පනතින් තරුණ නියෝජනය 25%ක් නිර්දේශ කර තිබේ. මැතිවරණ නීති සංශෝධනය පිණිස පත් කළ ජනාධිපති විමර්ෂණ කොමිසම් වර්තාව (ඩෙප් කොමිසම) කාන්තා නියෝජනය 25%ක් ලෙස තබා ගැනීමේ වැදගත්කම අවධාරණය කළ බව වාර්තා වී ඇත. කෙසේ වෙතත්, වර්ෂ 2018 ප්‍රාදේශීය සභා මැතිවරණයෙන් පසුව කාන්තා නියෝජනය තහවුරු කිරීමේ භාරය ආසන ජය නොගත් පක්ෂවලට පැවරිම හේතුවෙන් එකී පක්ෂවලට කෙටි කාලීන මෙන්ම දිගු කාලීන වශයෙන් අහිතකර බලපෑම් එල්ල වූ බවත්, දෙවන ලැයිස්තුවෙන් පත් කිරීමේදී විවිධ අක්‍රමිකතා සිදු වූ බවත් පොදුවේ පිළිගැනීමට ලක්ව තිබේ. මීළඟ මැතිවරණයක් පැවැත්වීමට පෙර මෙකී ප්‍රධාන ගැටලු විසඳා ගැනීම වැදගත් වේ.

### ගැටලුව
කාන්තා නියෝජනය 25%ක මට්ටමේ පවත්වා ගන්නා අතර:

1. කොට්ඨාස ජයග්‍රහණය නොකරන පක්ෂවලට ඇතිවන අහිතකර බලපෑම වළක්වා ගැනීමට;
2. තරුණ නියෝජනය කප්පාදු නොවීමට; සහ
3. නියෝජිත සංඛ්‍යාව විශාල වශයෙන් ඉහළ යෑම වැළැක්වීමට

හැකි වන පරිදි වර්තමාන පළාත් පාලන පනත කඩිනමින් සංශෝධනය කර ගන්නේ කෙසේද?

මේ සඳහා අනුගමනය කළ හැකි විකල්ප දෙකක් පහත සලකා බැලේ.

**විකල්පය 1 - පළාත් පාලන මැතිවරණයේදී පළමු ලැයිස්තුවේ අනිවාර්ය කොට ඇති කාන්තා අපේක්ෂක ප්‍රතිශතය 20% දක්වා ඉහළ දැමීම**

පළාත් පාලන මැතිවරණ අඥාපනතට අදාළව සිදු කර ඇති වර්ෂ 2017 අංක 17 දරන පනත සහ 2023 අංක 30 දරන පනත් දෙක මගින් සංශෝධනය කෙරී ඇත. එහි එන පළමු ලැයිස්තුව යටතේ එක් එක් කොට්ඨාස මට්ටමින් තරග කරන කාන්තා අපේක්ෂක ප්‍රතිශතය 10%ක් විය යුතු බව සඳහන් කොට තිබේ. මෙය 20% දක්වා වැඩි කිරීම මගින් කොට්ටාස මට්ටමින් තරඟ කරන කාන්තාවන් සංඛ්‍යාත්මකව වැඩි වන අතර ඔවුන් අතරින් ජයග්‍රහණය කරන අය දැනට පවතින ක්‍රමය යටතේ ජය ගැනීමට ඉඩ ඇති සංඛ්‍යාවට වඩා වැඩි විය හැකිය. මෙමගින් ඉහත ගැටලුවලින් ඇතැම් ඒවා විසඳා ගනීමට හැකියාව ලැබෙනු ඇත. මැතිවරණ කොමිසම මගින් දිනේශ් ගුණවර්ධන කොමිසමට සහ ඩෙප් කොමිසටම මෙම යෝජනාව ඉදිරිපත් කර තිබේ.

මෙම විකල්පයට පක්ෂව:

1. සභාවක් පිහිටුවීමට අවශ්‍ය වන 25%ක කාන්තා නියෝජනයෙන් වැඩි කොටසක් (ආසන්න වශයෙන් 20%ක්) කොට්ටාස මට්ටමින් තේරී පත් වන්නේ නම් එවිට දෙවන ලැයිස්තුව මත ඇති කෙරෙන පීඩනය සීමා වනු ඇත.
2. එය නියෝජිත සංඛ්‍යාව ඉහළ යාම වළක්වා ගැනීමට හේතු වෙයි.
3. කාන්තා නියෝජනය හඳුන්වා දී මේ වන විට වසර 7ක් ගත වී ඇති අතර කාන්තාවන්ගේ දේශපාලන සහභාගිත්වය සැලකිය යුතු ලෙස වර්ධනය වී තිබේ. එබැවින් කොට්ඨාස මට්ටමින් කාන්තාවන් ඉදිරිපත් කිරිමට පක්ෂවලට සහ ස්වාධීන කණ්ඩායම්වලට වසර 2017දී පනත හඳුන්වා දුන් අවස්ථාවේ පැවතියාට වැඩි ශක්‍යතාවක් පවතී.

මෙම විකල්පයෙන් නොවිසඳෙන ගැටලු:

1. තරුණ නියෝජනය සහ කාන්තා නියෝජනය සම්බන්ධයෙන් පක්ෂ මත බලපෑමක් ඇති වීම උග්‍ර විය හැකි ය. පළමු ලැයිස්තුවේ 25%ක තරුණ නාම යෝජනා සම්පූර්ණ කිරිම පිණිස තරුණ කාන්තාවන් නම් කිරීමට සිදු වීම තව දුරටත් ත්‍රීව වීමට ඉඩ තිබේ.

**විකල්පය 2 - පළාත් පාලන මැතිවරණ කොට්ඨාසවලින් 25%ක් කාන්තාවන් පමණක් වෙන් කළ කොට්ඨාස ලෙස නම් කිරීම** සහ දෙවන ලැසිස්තුවේ කාන්තා ප්‍රතිශතය 40% දක්වා පහත හෙළීම

නියමිත කොට්ටාස සංඛ්‍යාවෙන් සියයට විස්සක් කාන්තාවන් පමණක් තරග කරන කොට්ඨාස ලෙස නම් කිරීම මගින්, සභාව පිහිටුවීමේදී නියත වශයෙන් 20%ක දායකත්වයක් පළමු ලැයිස්තුවෙන් ලැබෙන බැවින්, දෙවන ලැයිස්තුව මත ඇති කරනු ලබන පීඩනය සීමා වේ. මෙසේ කාන්තා කොට්ඨාස නම් කිරීම, මැතිවරණයෙන් මැතිවරණයට චක්‍රයක් සේ මාරු විය යුතු අතර, එකී චක්‍රය ඉදිරි පළාත් පාලන මැතිවරණ පහකට ද අදාළ වන පරිදි ගැසට් කොට දැක්විය යුතුය. කොට්ඨාස අංකය භාවිත කොට මෙය සිදු කළ හැකිය.

මෙම විකල්පයට පක්ෂව:

1. සභාව පිහිටුවීමට අවශ්‍ය 25% ප්‍රතිශතය පහසුවෙන් ලැබේ. දෙවන ලැයිස්තුවනේ අවශ්‍ය වන අවමය 5%ක් පමණි.
2. දෙවන ලැයිස්තුව නිදහස් වීමෙන්, තරුණ කෝටාව වඩාත් ඵලදායී ලෙස ක්‍රියාත්මක කළ හැකිය. මෙය, දැනට ඇතැම් වාර්තා මගින් නර්දේශ කර ඇති පරිදි, තරුණ නියෝජනය අනිවාර්ය නොකර නිර්දේශාත්මක කිරිමට විකල්ප ලෙස, කෝටා දෙකම සක්‍රිය කිරීමට භාවිත කළ හැකිය.
3. කාන්තා අපේක්ෂකත්වය සඳහා වෙන් කළ කොට්ඨාස පෙර තියා දැන ගැනීමට ලැබීම මගින් පක්ෂවලට තම අපේක්ෂකයන් පෙර තියා සැලසුම් කිරිමට අවස්ථාව ලැබේ.

මෙම විකල්පයට එරෙහිව:

1. මෙම ක්‍රමය මගින් ඇතැම් කොට්ඨාසවල දැනට සූදානම් කර සිටින පුරුෂ අපේක්ෂකයන්ට තරග කිරීමේ අවස්ථාව අහිමි වීම එළඹෙන මැතිවරණය සඳහා බාධාවක් විය හැකිය. එවන් අවස්ථාවන්හිදී එකී අපේක්ෂකයන්, දෙවන ලැයිස්තුවෙන් නම් කිරිමේ හැකියාව පවතී.
2. මෙම ක්‍රමය මගින්, කාන්තාවන්ට යම් කොට්ඨාසයකින් පමණක් අවස්ථාව ලැබීම හේතුවෙන් දැනට දේශපාන පසුබිමක් ගොඩ නගාගෙන ඇති කාන්තාවන්ට අගතියක් වීමේ කෙටිකාලීන අවදානම. එය වැළැක්වීමට ද දෙවන ලැයිස්තුව භාවිත කළ හැකිය.